# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1097 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 04/07/2024<br>පැය 1425 |

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

### විෂ මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා ක්‍රියාත්මක යුක්තිය මෙහෙයුමෙහි දෙවන අදියර ක්‍රියාත්මක කිරීම - පොලිස් මූලස්ථානය.

විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හා බෙදාහරින්නන්ගේ ජාලයන් මර්ධනය කර ඔවුන් අත්අඩංගුවට ගනිමින් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම මූලික අරමුණ කරගනිමින් මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාගේ උපදෙස් මත, පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ පූර්ණ අධීක්ෂණයෙන් යුතුව ආරම්භ කරන ලද **"යුක්තිය"** මෙහෙයුම මුළු දිවයිනම ආවරණය වන පරිදි සාර්ථකව ක්‍රියාත්මකව පවතී.

මෙහෙයුමෙහි දෙවන අදියර 2024.07.04 වන අද දින පොලිස්පතිතුමාගේ මූලිකත්වයෙන් ආරම්භ කල අතර පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ගේ සෘජු අධීක්ෂණය හා උපදෙස් යටතේ පැය 24 පුරාම මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මේ සඳහා පොලිස් මූලස්ථානයේ ස්ථාපිත විශේෂ මෙහෙයුම් මැදිරිය පැය 24 පුරාම ක්‍රියාත්මක අතර විෂ මත්ද්‍රව්‍ය පිළිබඳව තොරතුරු දන්නා පුද්ගලයින්ට පොලිස් මූලස්ථානයේ ස්ථාපිත කර ඇති මෙම විශේෂ මෙහෙයුම් මැදිරියට හෝ සියලුම කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරුන් වෙත නිකුත් කර තිබෙන මේ සඳහාම වූ විශේෂ ජංගම දුරකථන අංකයන්ට තොරතුරු ලබා දිය හැකිය. මෙම දුරකථන වලට ලැබෙන ඇමතුම් වලදී අමතන්නන්ගේ දුරකථන අංක පෙන්නුම් නොකරන බැවින් තොරතුරු දැනුම් දෙන්නාගේ රහස්‍ය භාවය සුරැකෙනු ඇත. එසේම ops.narcotics@police.gov.lk යන ඊ මේල් ලිපිනයටද තොරතුරු ලබා දීමේ හැකියාව ඇත.

පොලිස් මූලස්ථාන විශේෂ මෙහෙයුම් මැදිරිය - 071 – 8598800

විද්‍යුත් තැපැල් ලිපිනය - ops.narcotics@police.gov.lk

පොලිස් කොට්ඨාස භාර නිලධාරීන්ගේ දුරකථන අංකයන්

| අනු අංකය | කොට්ඨාසය | දුරකථන අංකය |
|---|---|---|
| 01 | කොළඹ උතුර | 071-8598801 |
| 02 | කොළඹ දකුණ | 071-8598803 |
| 03 | කොළඹ මධ්‍යම | 071-8598804 |
| 04 | නුගේගොඩ | 071-8598805 |
| 05 | ගල්කිස්ස | 071-8598806 |
| 06 | ගම්පහ | 071-8598807 |
| 07 | මීගමුව | 071-8598808 |
| 08 | කැළණිය | 071-8598809 |
| 09 | පානදුර | 071-8598810 |
| 10 | කළුතර | 071-8598811 |
| 11 | මාතර | 071-8598812 |
| 12 | තංගල්ල | 071-8598813 |
| 13 | ගාල්ල | 071-8598814 |
| 14 | ඇල්පිටිය | 071-8598815 |
| 15 | මහනුවර | 071-8598816 |
| 16 | මාතලේ | 071-8598817 |
| 17 | තෙල්දෙණිය | 071-8598818 |
| 18 | ගම්පොල | 071-8598819 |
| 19 | නුවරඑළිය | 071-8598820 |
| 20 | හැටන් | 071-8598821 |
| 21 | කුරුණෑගල | 071-8598822 |
| 22 | කුලියාපිටිය | 071-8598823 |
| 23 | නිකවැරටිය | 071-8598824 |
| 24 | පුත්තලම | 071-8598825 |
| 25 | හලාවත | 071-8598826 |
| 26 | අනුරාධපුරය | 071-8598827 |
| 27 | පොළොන්නරුව | 071-8598828 |
| 28 | කැබිතිගොල්ලැව | 071-8598829 |
| 29 | රත්නපුරය | 071-8598830 |
| 30 | ඇඹිලිපිටිය | 071-8598831 |
| 31 | කෑගල්ල | 071-8598832 |
| 32 | සීතාවකපුර | 071-8598833 |
| 33 | යාපනය | 071-8598834 |
| 34 | කන්කසන්තුරය | 071-8598835 |
| 35 | වව්නියාව | 071-8598836 |
| 36 | මන්නාරම | 071-8598837 |
| 37 | කිලිනොච්චිය | 071-8598838 |
| 38 | මුලතිව් | 071-8598839 |

| | | |
|---|---|---|
| **39** | **මඩකළපුව** | **071-8598840** |
| **40** | **අම්පාර** | **071-8598841** |
| **41** | **ත්‍රිකුණාමලය** | **071-8598842** |
| **42** | **කන්තලේ** | **071-8598843** |
| **43** | **බදුල්ල** | **071-8598844** |
| **44** | **බණ්ඩාරවෙළ** | **071-8598845** |
| **45** | **මොණරාගල** | **071-8598846** |

2024.07.04 වන දින සිට 2025.01.01 දක්වා වූ කාලසීමාව තුල **"යුක්තිය"** වැඩසටහනේ දෙවන අදියර ක්‍රියාත්මක කරන අතර, තොරතුරු ලබාදිය හැකි ඉහත අංකයන් පිළිබඳව මාධ්‍ය මගින් ප්‍රචාරයක් ලබා දීම තුළින් විෂ මත්ද්‍රව්‍ය සමාජයෙන් තුරන් කිරීම සඳහා ශ්‍රීලංකා පොලිසිය දරන උත්සාහයට සහයෝගය ලබාදෙන ලෙස සියළුම මාධ්‍ය ආයතන මගින් ඉල්ලා සිටිමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**